





අමතක කරන්නට කෙතරම් උත්සාහ දැරුවද නිමන්ත හා බැඳුණ සුන්දර මතක කෙසේ නම් සිතින් මකා දමන්න ද? මේ ජීවිතය හැර දමා යා නොහැකි බව තහවුරු කරන්නේ ඒ මතක සටහන් නොවේ ද?

අමන්දි අද නිවසින් පිටත් වූයේ උදෑසන පහටත් පෙර ය. නිමන්ත අවදි නොවන ලෙස ඇඳ පැළඳ ගැනීම අමන්දිට දැන් පුරුදු ය. ඇය කාමරයෙන් පිටවන්නට පෙර නිදා සිටිනා නිමන්ත දෙස බොහෝ වේලාවක් බලා සිටියා ය. තමා නිසා ඔහු මහත් කරදරයකට පත්ව සිටින්නේය යන හැඟීම ඇගේ සිත පීඩාවට පත් කළේ ය. තමා වැනි රෝගී කාන්තාවක හා විවාහ වන්නට සිදුවීමේ අභාග්‍යය දරා සිටින ඔහු ඒ පිළිබඳව ඉඟියකින් වත් මැසිවිල්ලක් පළ නොකළ බව සිහිපත් වන විට ඇගේ සිතට ඇති වන්නේ මහත් වේදනාවකි. ඒ වේදනාව ඇගේ ඇස් කඳුළින් පුරවයි.

මේ හැඟීම් වලට ජීවත්වන්නට ඉඩ දිය යුතු නොවේ. එයින් සිදුවන්නේ මේ බැඳීම් තවත් වැඩි වීම පමණකි. නියත වශයෙන්ම දිනෙක හැර යන්නට සිදුවන සියල්ල කෙරෙහි ඇති සකලවිධ බැඳීම් සියල්ල පුපුරවා හළ යුත්තේ ය. ඒ සඳහා අවශ්‍ය වන අති මහත් ශක්තිය එක්තැන් කරගන්නට තමන්ට හැකි යයි අමන්දි සිතුවා ය. ලෝකයම දවා අලු කර දමන්නට හැකි තරම් උණුසුම් සුසුමක් පිට කළ අමන්දි කාමරයෙන් පිට වූවා ය.

සිත්තර ආම්පන්න සහිත බෑගය කරේ එල්ලා ගත් අමන්දි නිවසින් එළියට බසින විටත් විශ්වජිත් ගේ මෝටර් රථය ගේට්ටුවෙන් එපිට පාරේ නවතා තිබුණි.

ආම්පන්න බෑගය කාරයේ පසුපස ආසනය මතට දැමූ අමන්දි ඉදිරි අසුනේ වාඩි වී විශ්වජිත් ගේ මුහුණ බැලුවා ය.

"මං නිසා උදෙන්ම නැගිට්ටින්න වුණා නේද..?" ඇය ඇසුවා ය.

ඔහු සිනාසුණෝ ය.

උදෑසන බැවින් මාර්ගය නිස්කලංක ය. සිහින් මීදුමක් ගලා යමින් තිබුණද මාර්ගය පැහැදිලි ය. විශ්වජිත් වාහනය පැදෙව්වේ කල්පනාවෙන් බර වූ සිතකින් ය. අවිස්සාවේල්ලට එන තෙක්ම දෙදෙනා අතර වැඩි කතාබහක් නොවී ය.

මීදුමින් වැසීයමින් තිබෙන කඳු පෙළක් සහිත පරිසරයක් සිත්තමට නගන්නට අවශ්‍ය වූයේ අමන්දිට ය. සිත්තමට නැගීමට සුදුසු පරිසර දර්ශන ඕනෑ තරම් දැන සිටිය ද බෙලිහුල්ඔය ට ඔබ්බෙන් වූ ප්‍රදේශයක් විශ්වජිත් තෝරා ගත්තේ එතැන අමන්දි ගේ සිතැඟි වලට ගැලපෙනම පරිසරය ලෙස ඔහු අනුමාන කළ නිසා ම නොවේ. එවන් නිස්කලංක පරිසරයක ගත කරන දිනක් අමන්දිගේ මානසික සුවයට හේතුවේ යයි සිතූ නිසා ය යන්න එක් හේතුවක් විය. එයටත් වඩා මේ ගමනින්ම සුමන හාමුදුරුවන්ගේ සෙනසුනට අමන්දි කැටුව යා හැකි යයි ඔහුට සිතුණ නිසා ය.

ඒ අරමුණ අමන්දිගෙන් හැකි තරම් වේලාවක් වසන් කරගෙන සිටින්නට ඔහුට අවශ්‍යව තිබුණි.

මතු සම්බන්ධයි



## කලාසූරි සතිස්චන්ද්‍ර එදිරිසිංහ

# පරාස්සයා මෙල්බන් වේදිකාවට

*ප්‍රවීණ නාට්‍යවේදී රෝහණ දන්දෙනියගේ "පරාස්ස" නාට්‍යය යේ නව නිෂ්පාදනය අගෝස්තු මස 23 සහ 24 යන දෙදින තුළ ජෝන්ද සිල්වා සමරු රඟහලේ දී වේදිකා ගත වෙනවා. රෝහණ දන්දෙනිය විසින් පර්යේෂණ රංගයක් වශයෙන් හත්තෑව දශකයේ කොළඹ විශ්ව විද්‍යාලයේ නාට්‍ය සහ රංගකලා පශ්චාත් උපාධි ධාරීන් සඳහා "ලෝකෙට ලොක්කා" සහ "නරලොවින් එකෙක්" යන නම් වලින් නිර්මාණය කරනු ලැබූ මෙම නාට්‍යය ම රෝහණ දන්දෙනිය ගේ අනුරාධපුර නිර්මාණසේනා සංවිධානය වෙනුවෙන් 1980 වේ දී "පරාස්ස" නමින් නිෂ්පාදනය කරන ලදී. ජාතික රූපවාහිනී සංස්තාව මගින් රූගත කරන ලදුව විකාශය කිරීමත් සමග වඩාත් ජනප්‍රිය භාවයකට පත් වූ "පරාස්ස" දශක තුනකට පසුව රෝහණ දන්දෙනිය විසින්ම "රාස්ස සහ පරාස්ස" නමින් නව නිෂ්පාදනයක් ව ගෙන එනු ලබයි.*

*මෙම නාට්‍යය ඔක්තෝබර් 07 Ringwood ys George Wood Performing Art Centre හිදී පස්වරු 6 ට මෙල්බන්වාසී ඔබහට රසවිදීමට අවස්ථාව සැලසී තිබෙනවා. "රාස්ස සහ පරාස්ස" ඕස්ට්‍රේලියානු සංචාරයේ සැප්තැම්බර් 22 සිඩ්නි හි ද 29 ඇඩිලේඩ්හි ද ඔක්තෝබර් 13 පර්ත් හි දී ද රංග ගත කෙරේ. මෙහි පහත දැක්වෙන්නේ මෙම නාට්‍ය නව නිෂ්පාදනය සහ ඔස්ට්‍රේලියානු නව නිෂ්පාදනය වෙනුවෙන් ප්‍රවීණ නාට්‍යවේ දී කලාසූරි සතිස්චන්ද්‍ර එදිරිසිංහ මහතා තළ සටහනකි".*

## ජනශ්‍රැති ආශ්‍රිත වේදිකා රංග පර්යේෂණය

# රාස්ස සහ පරාස්ස



මෙම නාට්‍යය ප්‍රකට ජන කතාවක් පාදක කරගත් නිර්මාණයකි. එසේ ම ජන නාට්‍ය කලා සම්ප්‍රදායෙන් ගොඩනැගූ පර්යේෂණාත්මක අත්හදා බැලීමකි. මිනිස් ජීවිත සියුම් ව විවරණය කරන පරාස්ස නාට්‍යය ජන කතාවේ එන සරළ බවට වඩා බහුල ජීවිත අත්දැකීම් ලබා දීමට සමත්, නැරඹිය යුතු වේදිකා නාට්‍යයක් ලෙස හඳුන්වා දෙමි. ප්‍රවීණ ලේඛක හා නාට්‍යවේදී රෝහණ දන්දෙනිය සූරීන් විසින් මෙම නාට්‍යය රචනා කොට අධ්‍යක්ෂණය කොට ඇත.

පුංචිරාල අලස හේන් ගොවියෙකු වූයේ කෙසේද? අලස මිනිසාට යකුන් දමනය කිරීමේ හැකියාව පැන නැගුණේ ඔහුගේ චරිත අභ්‍යන්තරයෙන් ද? පුරන්සිනා තම ස්වාමි පුරුෂයා දෙස මුලදී දැක් වූ දෘෂ්ටිය වෙනස් වූයේ කෙසේද? නාට්‍යය නැරඹීමෙන් මෙම ප්‍රශ්නවලට පිළිතුරු සොයා පාදා ගැනීමට රචකයා විසින් ප්‍රේක්ෂකයාට ඉතිරි කොට ඇත. ඒ අනුව මෙය ගවේෂණාත්මක නාට්‍යයකි.
ශ්‍රැති ගෝචර ජන කතාව ජීවිත පරිඥාණයක් ලබා දීමට හැකිවන අයුරින් දන්දෙනිය මහතා එය දෘශ්‍ය කාව්‍යයක් ලෙසින් නිර්මාණය කොට ඇත. ගැඹුරක් සහිත අදහස් දහරක් ප්‍රේක්ෂක සිතට පහළ වන අයුරින් නිෂ්පාදනය වීම වැදගත් ලක්ෂණයකි. නාට්‍යයේ ඒකාබද්ධතාව එහි සාර්ථකත්වයට වෙසෙසින් හේතු වේ.

එදා ජන කතාකරුවාගේ අරමුණ වූයේ තම ජාතිය සතු ව ඇති සාම්ප්‍රදායික ඥාණ සම්භාරය පරපුරකින් පරපුරකට සම්ප්‍රේෂණය කිරීමයි. එවැනි අරමුණකට එහා ගිය අත්දැකීමක් තුළින් ආනන්දයෙන් ප්‍රඥාවක් ලබා දීමට මෙම නාට්‍ය රචකයා සමත් වී ඇත. මේ ජන කතාකරුවාට අවශ්‍ය වූයේ මිනිසා තුළ සැඟවී ඇති මහිමය ගෙනහැර පෑමයි. එම අදහස නාට්‍යෝචිත අවස්ථාවන් උපයෝගී කරගෙන විචක්ෂණ භාවයකින් යුක්ත ව රාස්ස හා පරාස්ස තුළින් පිළිඹිබු කර ඇත.

මෙම වේදිකා නාට්‍යය ඕස්ට්‍රේලියාවේ වෙසෙන බුද්ධිමත් රසික ජනතාවට අපූර්ව වේදිකා අත්දැකීමක්



වේ යැයි හඟිමි. තම මව්බිමේ නිර්මාණයක් රසවිදීමට ලැබීම අමතක නොවන අත්දැකීමක් වනු නොඅනුමාන ය. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් මෙම පිටපත කියවා අතිශයින් සතුටට පත් වූවා පමණක් නොව එය නිර්මාණයක් වශයෙන් යළිත් දැකීමට දැඩි අභිරුචියක් තිබූ බව එතුමන් විසින් ලියන ලද සටහනකින් මම දුටිමි.

වේදිකාවේ කෘතහස්ත නළු නිළියන් වූ ජයලත් මනෝරත්න, ශ්‍රියන්ත මෙන්ඩිස්, නිශ්ශංක දිද්දෙනිය, රෝහණ බැද්දගේ සමඟ මාදනී මල්වත්තගේ ප්‍රධාන චරිතයන් නිරූපණය කරන මෙම නාට්‍යයේ නැටුම් හා සංගීත නිර්මාණය රෝහණ බැද්දගේ සූරීන්ගේ ය. හීනටිගල ප්‍රේමදාස කලා අධ්‍යක්ෂවරයා වන අතර ප්‍රවීණ කලා ශිල්පී දී. ග. සෝමපාල ප්‍රචාරක සැලසුම් නිර්මාණ ශිල්පියා ය.
අදටත් හෙටටත් ගැලපෙන සනාතන මනුෂ්‍ය ගුණාංග සහිත මෙම නාටකය ජාත්‍යන්තරයට ගෙනයෑමට සමත් වීම සිංහල නාට්‍ය කලාවේ ඉදිරි ගමනට ශක්තියකි. මහාචාර්ය සරච්චන්ද්‍රයන් ජනකතා ඇසුරින් නිෂ්පාදිත රත්තරන්, එලොව ගිහින් මෙලොව ආවා, දයානන්ද ගුණවර්ධනයන්ගේ නරිබෑනා, ජසයා ලෙන්චිනා, එම්. එච්. ගුණතිලකගේ සක්කාය දිට්ඨි යන නාට්‍යයන්ගෙන් ප්‍රේක්ෂකයා ලත් චමත්කාර ජනක ආස්වාදය අතිමහත් ය.



එයිනුත් ඔබ්බට ගිය උසස් වින්දනයක් රෝහණ දන්දෙනියගේ රාස්ස සහ පරාස්ස තුළින් ලැබිය හැකිය යන්න මගේ හැඟීමයි.

වැව් බැඳි රාජ්‍යයේ ගැමිවහර නාටයෝචිත පරිදි යොදා ගනිමින් කෝලම් රංග ශෛලියේ ලක්ෂණයන් උපයෝගී කර ගනිමින් නිර්මිත මෙම ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණය රසිකයාට ආනන්ද ජනක ආශ්වාදයක් ලබා දෙන ස්වතන්ත්‍ර නිර්මාණයක් බවට නොපැකිල ව ප්‍රකාශ කළ හැකි ය. විදේශ ගත ව සිටින ප්‍රේක්ෂක ප්‍රජාවට දේශීය ශෛලියෙන්, සිංහල උරුවෙන් උසස් නාට්‍යයක් නැරඹීමේ දුර්ලභ අවස්ථාව උදා වී ඇත. අවස්ථා නිරූපණය, බෙර වාදනය, සංගීත නිර්මාණය, නර්තනය, ගායනය හා චරිත නිරූපණය සිදු වීම් වලට බාධාවක් නොවන අයුරින් උචිත පරිදි අඛණ්ඩ ව ගලා යාම මෙන්ම රංගන ශිල්පීන්ගේ මුවට නංවන අර්ථවත් සංවාද ද ඉතා අගනේ ය.

අඳුරු වැසි වලාවක රිදී රේඛාවක් දකින්නා සේ මම රෝහණ දන්දෙනියගේ ප්‍රතිභාව දකින්නෙමි. නාට්‍යය ලෝලීන් කුල්මත් කරන්නේ ඒ ප්‍රතිභාවයි.

කලාසූරි සතිස්චන්ද්‍ර එදිරිසිංහ
545/2,
නුංගමුගොඩ,
කැලණිය.